# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1970/8 - 2016 ජුනි මස 07 වැනි අඟහරුවාදා - 2016.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදයක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය)**

**විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය**

විනිමය පාලන පනතේ 03 සහ 48 වන වගන්ති සමඟ කියවෙන එකී පනතේ 5 සහ 7 වන වගන්ති වලට අනුව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමකට විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගෙන් ණය ලබා ගැනීම සඳහා මෙයින් අවසර ප්‍රදනය කරනු ලැබේ.

1. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම්, ඇපයෙන් සීමිත සමාගම් සහ අක්වෙරළ සමාගම් හැර අනෙකුත් සියළුම සමාගම් සඳහා මෙම අවසරය අදාල වේ.

2. ණය ගැණුම්කරුවා විසින් ණය ලබා ගන්නා විදේශ ව්‍යවහාර මුදලින්ම විදේශ විනිමය ඉපැයීම් ඇති බව සනාථ නොවේ නම්, එකී ණය ගැණුම්කරුවා විසින් ශ්‍රී ලංකාවේ ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමඟ ඇති කරගත් යෝග්‍ය හෙජින් උපකරණ හරහා විනිමය අවධානම අවම කළ යුතුය.

3. ණය මුදල ගෙවා නිම කිරීමට අපේක්ෂිත කාලය අවම වශයෙන් වසර 3 ක් විය යුතුය.

4. ලබාගන්නා උපරිම ණය ප්‍රමාණය, අවම වශයෙන් ආසන්නතම පූර්ව වර්ෂ 3 ක විගණනය කරන ලද මූල්‍ය වාර්තා පදනම් කරගෙන ණය මුදල ගෙවීමට සමාගමට ඇති හැකියාව සහ ව්‍යාපාර සැලසුම් මත තීරණය විය යුතුය.

5. ශ්‍රී ලංකාවේ දැනට පවතින වෙළඳපොළ පොළී අනුපාතික සමඟ සසඳන විට ණය මුදල ලබාගන්නා පොළී අනුපාතිකය තරඟකාරී හා වාසිදයක විය යුතුය.

6. ණය ගැණුම්කරුවා විසින් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක ඕනෑම අනුමත විදේශ ව්‍යවහාර මුදලකින් පවත්වාගෙන යනු ලබන විදේශීය වාණිජ ණය ගැණුම් ගිණුමක් හරහා සියළුම ණය මුදල් සහ ඊට අදල ගෙවීම් සිදු කළයුතුය.

ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු,
විනිමය පාලක.

2016 ජුනි මස 07 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා මහ බැංකුවේ දී ය.

06 - 293


1A - G 23519 — 27 (2016/06)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*